සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 2025
Second Term Test - 2025

8 ශ්‍රේණිය | සිංහල භාෂාව හා සාහිත්‍යය | කාලය පැය 02 යි

නම/ විභාග අංකය:

## I - කොටස

සැලකිය යුතුයි
- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- 1 - 20 දක්වා ඇති ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

01. කිරිබණ්ඩාගේ කේන්තිය අකාමකා වී ගියේ ය. මෙහි ඉරි ඇඳි පදය,
(i) ප්‍රස්තාව පිරුළකි. (ii) රූඪියකි. (iii) විශේෂණ පදයකි. (iv) යුගල පදයකි.

02. ''බලය පිරිහීම'' යන අදහස දෙන රූඪිය වන්නේ,
(i) අන්තිම ඉත්තත් ඇදීම. (ii) සෙනසුරා ලබලා.
(iii) පොරකටු ගෙවිලා. (iv) කරල පැහිලා.

03. මහාප්‍රාණ අක්ෂර පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,
(i) ක ජ ට ත ප (ii) ග ජ ඩ ධ බ (iii) ඛ ඡ ඨ ත ප (iv) ඝ ඣ ඪ ධ භ

04. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.
(i) වර්ධනය, මර්ධනය, ලේඛකයා (ii) වර්ධනය, මර්දනය, ලේකම්
(iii) මූර්දජ, පරිඝණකය, ලේඛම් (iv) ප්‍රාර්තනා, අර්තය, ආභරණ

05. අකාරාදී පිළිවෙළ නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.
(i) කන්ද, කැන්ද, කුන්ද, කෙන්ද (ii) ආඳා, අලියා, ඇයා, ඇතා
(iii) කතරගම, කෑගල්ල, කාගම, කැළණිය (iv) මාතර, මහනුවර, මීරිගම, මිරිස්ස

06. ''ගොඩැල්ලේ තරම දැනගෙන ළිඳ කපනු'' මෙහි ඉරිගසා ඇති පදය
(i) ආශිර්වාද ක්‍රියාවකි. (ii) පූර්ව ක්‍රියාවකි.
(iii) විධි ක්‍රියාවකි. (iv) මිශ්‍ර ක්‍රියාවකි.

07. අසුබ පැතුම් අර්ථය ගෙන දෙන ආශිර්වාද ක්‍රියාවක් ඇතුළත් ප්‍රකාශය වන්නේ,
(i) සුබ නව වසරක් වේවා ! (ii) ගව්වෙන් ගව්ව දිව මාළිග සෑදේවා !
(iii) සියලු සතුරෝ නැසෙත්වා ! (iv) වනන්තරේ වන සපුමල් පිපීයන් !

08. සචේතනික නාම පද දෙකක් සහ අචේතනික නාම පද දෙකක් ඇතුළත් පිළිතුර වන්නේ,
(i) අධිරාජ්‍යයා, උද්‍යානය, මල්, මාලිගාව (ii) කිරිල්ලිය, අධිරාජ්‍යයා, මම, ඔහු
(iii) අධිරාජ්‍යයා, කිරිල්ලිය, උද්‍යානය, මාලිගාව (iv) නගරය, උද්‍යානය, මල්, මාලිගාව

09. ගුණ නාම පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,
(i) නරක, පටු, පොත්, පැන් (ii) පස්, ගල්, වැලි, මැටි
(iii) ඇත්, මිනිස්, සිංහ, පක්ෂි (iv) උස, මහත, දක්ෂ, නරක

10. ''අපි දේශීය දේ අගය කරමු'' මෙහි ඉරිගසා ඇති නාම පද වර්ග පිළිවෙළින් ඇතුළත් පිළිතුර වන්නේ,

(i) සර්වනාම, සමාස නාම (ii) සර්ව නාම, තද්ධිත නාම

(iii) තද්ධිත නාම, සමාස නාම (iv) සමාස නාම, සර්ව නාම

11. ''මහලු මිනිසා කෝපයෙන් බැණ වදියි'' මෙහි ඉරිගසා ඇති පද වර්ගය වන්නේ,

(i) ක්‍රියා පද (ii) සමාස පද (iii) විශේෂණ පද (iv) නාම පද

12. පහත දී ඇති පද යොදා සෑදූ වාක්‍ය ඉදිරියේ ඇත. දී ඇති පදයේ අර්ථයට ගැළපෙන නිවැරදි වාක්‍යය තෝරන්න.

(i) තෙළිතුඩ - ගුරුළුගෝමී පඬිවරයා තෙළිතුඩෙන් අමාවතුර ලියුවේය.

(ii) අමාවක - අමාවක සඳ නැඟ එයි.

(iii) දසත් - මිනිස්සු දසත් විදා රංගනය බලා සිටිය හ.

(iv) පන්හිඳ - ගුරුළුගෝමී පඬිවරයා පන්හිඳෙන් අමාවතුර ලියුවේ ය.

13. දී ඇති බහු අර්ථ (බහ්වර්ථ) පද වලට සමාන අර්ථ පිළිවෙළින් ඇති පද පේළිය තෝරන්න.

කර - දිය - තුරු - පිය

(i) බෙල්ල, ජලය, තාත්තා, ගස් (ii) ගස්, ජලය, ගස්, බෙල්ල

(iii) බෙල්ල, ජලය, ගස්, තාත්තා (iv) කරන්න, ලෝකය, ජලය, බෙල්ල

14. පහත ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය තෝරා යටින් ඉරක් අඳින්න.

(i) වාක්‍යයක ආඛ්‍යාතය ලෙස යෙදෙන ක්‍රියා අනවසාන ක්‍රියා ලෙස හැඳින්වේ.

(ii) ආශිර්වාද ක්‍රියාව අවසාන ක්‍රියාවකි.

(iii) දැන්වීම් සකස් කිරීමේ දී ආකර්ෂණීය බව පිළිබඳ සැලකිලිමත් විය යුතු නොවේ.

(iv) ''රාත්‍රිය'' පද්‍ය පන්තිය ජී.එච්. පෙරේරා මහතාගේ නිර්මාණයකි.

15. පහත දී ඇති වාක්‍ය අතරින් නිවැරදි වාක්‍යය තෝරන්න.

(i) කුරුල්ලන් අහසේ පියාඹති. (ii) ගායිකාව ගී ගයන්නේ ය.

(iii) රියදුරෝ වාහන පදවති. (iv) අප පොත් පාඩම් කරමු.

16. පහත දී ඇති වාක්‍ය අතරින් වැරදි වාක්‍ය තෝරන්න.

(i) ලේඛකයෝ පොත් ලියති. (ii) ගොවියෝ කුඹුරු සාරවත් කළහ.

(iii) ගෙවිලිය කුඹුරට ඇඹුල ගෙන එන්නීය. (iv) ගවයෝ වමාරා කයි.

17. පුරුෂ ලිංග පද හා ස්ත්‍රී ලිංග පද නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.

(i) පියා - මව, මොනරා - සෙබඩ, අලියා - ඇතින්න

(ii) ඇතා - ඇතින්න, ගවයා - ගවදෙන, අලියා - කෙණර

(iii) මොනරා - මොනරී, බල්ලා - බැල්ලී, කුරුල්ලා - කිරිල්ලී

(iv) බල්ලා - බැල්ල, මොනරා - සෙබඩ, කොටියා - කොටිදෙන

18. ''අටසාළිස්'' යනු,

(i) 48 (ii) 84 (iii) 18 (iv) 68

19. 'වැසි වසිනා අහස අපි' නම් දේශාභිමානී ගීතය රචනා කරන ලද්දේ,

(i) පණ්ඩිත් අමරදේව මහතා. (ii) මහගමසේකර මහතා.

(iii) ගුණදාස අමරසේකර මහතා. (iv) එදිරිවීර සරච්චන්ද්‍ර මහතා.

20. 'අවුරුදු සිහිනය' කෙටිකතාව උපුටා ගත්තේ ගුණදාස අමරසේකර මහතා විසින් රචිත,

(i) කතා පහක් කෙටිකතා සංග්‍රහයෙනි.

(ii) විල්තෙර මරණය කෙටිකතා සංග්‍රහයෙනි.

(iii) එක්ටැමෙන් පොළොවට කෙටි කතා සංග්‍රහයෙනි.

(iv) රතු රෝස මල කෙටිකතා සංග්‍රහයෙනි.

(ලකුණු 2 x 20 = 40)

## II - කොටස

- **1, 2 හා 3 ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු ලියන්න.**

01. පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

(i) කාවාඩි නර්තනය ඇතුළත් ඇසළ පෙරහැර පවත්වන්නේ කුමන පුදබිම ආශ්‍රිතව ද?

(ii) අචේතනික නාම පද 04 ක් ලියන්න.

(iii) මනමේ නාට්‍යය නිර්මාණය කළ නාට්‍යකරුවා කවු ද?

(iv) 'සැබෑ ළෙන්ගතුකම' කෙටිකතාව නිර්මාණය කිරීමට ඇසුරු කරගත් කතාව කුමක් ද? එය ලියූ රචකයා කවු ද?

(v) අවුරුදු සිහිනය කෙටිකතාවේ ප්‍රධාන චරිතය කුමක් ද?

(ලකුණු 2 × 5 = 10)

02. පහත ඇති මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන 200 කට නො අඩු රචනයක් ලියන්න.

(i) මා දුටු ඇසළ පෙරහැර

(ii) කියවීමෙන් පෝෂණය වෙමු.

(iii) බක්මහේ අසිරිය.

(iv) ප්‍රිය වචන කතා කරමු.

(v) සුන්දර රාත්‍රියක්.

(ලකුණු 20)

03. දිනෙන් දින ම විවිධ මත්ද්‍රව්‍ය වර්ග ජනතාව අතරට එයි, පාසල් දරුවන් පවා මත්ද්‍රව්‍යය භාවිතා කරන බව දැන ගන්නට ඇත. මේ නිසා දරුවන්ගේ අධ්‍යාපනය කඩා වැටීම, සෞඛ්‍ය තත්ත්වය පිරිහීම වැනි විනාශ සිදු වේ. එසේ ම විවිධ අපචාර ක්‍රියා කරමින් නීතියට හසුවෙයි. මේ නිසා පාසල් දරුවන් මත්ද්‍රව්‍යවලින් බේරා ගැනීමට පාසලේ සෞඛ්‍ය ප්‍රවර්ධන සංගමය වැඩසටහනක් සකස් කර ඇත එමගින් පාසල් දරුවන් හා වැඩිහිටියන් දැනුවත් කිරීමට සුදුසු දැන්වීම් පත්‍රිකාවක් සකස් කරන්න.

(ලකුණු 10)

04. ඔබේ පෙළ පොතේ ඇතුළත් පහත උද්ධෘත ඇසුරෙන් විමසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ''ඉඳා, ඉක්මනට කඩේට ගිහිල්ලා නූල්රෝද දෙකක් අරගෙන වරෙන්'

(අ) මෙම ප්‍රකාශය කළේ කවු ද?

(ආ) මෙම ප්‍රකාශය කළේ කා හට ද?

(ii) ''මේ... ඇත්තට ම ඔහේ බත් කෑවේ මොනවා එක්ක ද?''

(අ) මෙම ප්‍රකාශ ඇතුළත් පාඩම කුමක් ද?

(ආ) මෙම ප්‍රකාශ කළේ කාට ද?

(iii) ''මට මාලිගාව සුදුසු තැනක් නොවෙයි. මට කුඩුවක් තනන්න.''

(අ) මෙම ප්‍රකාශය ඇතුළත් පාඩම කුමක් ද?

(ආ) මෙම ප්‍රකාශය කළේ කවු ද?

(iv) ''ආච්චි කොබෝගම දන්නව ද?''

(අ) මෙම ප්‍රකාශය අයත් පාඩම කුමක් ද?

(ආ) මෙහි ආච්චි යනුවෙන් අමතන්නේ කාට ද?

(v) ''උඹේ කෙහෙල්මල් හවරිය හින්දා මගේ හේනේ කුඹුරේ වැඩත් පාළු වුණා''

(අ) මෙසේ කියන්නේ කවු ද?

(ආ) මෙම ප්‍රකාශය කරන්නේ කාට ද? (ලකුණු 2 × 5 = 10)

05. පහත දී ඇති වාක්‍යවල හිස්තැනට ගැළපෙන පද යොදා හිස්තැන් සම්පූර්ණ කරන්න.

(i) මම සුවපත් ..............................................

(ii) ............................................... නිවන් දකිහුවා.

(iii) මලිති හෙට රැස්වීමේ දී ජන ගායනා ඉදිරිපත් ...............................

(iv) ......................................... හෙට ක්‍රිකට් තරගයක් සඳහා ඔස්ට්‍රේලියාවට යන්නෝ ය.

(v) තාත්තා සැටියේ දිගා වී පුවත් පත ............................................

(vi) ............................................. කඩිමුඩියේ රාත්‍රි ආහාරය පිළියෙල කරයි.

(vii) නා හිමියෝ දහම් ................................................................

(viii) ලොකු අයියා ගිය සතියේ ජපානයේ සිට ලංකාවට ......................................................

(ix) සරුංගල් අහසේ .......................................................

(x) දිය ඇලි කඳු මුදුනෙන් පහළට .......................................................

(ලකුණු 1 × 10 = 10)

06. පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ශ්‍රී ලාංකිකයෙකු වූ ආනන්ද කෙන්ටිශ් කුමාරස්වාමි දහනව වැනි සියවසේ පහළ වූ ශ්‍රේෂ්ටතම ආසියාතිකයා ලෙස පිළිගැනේ. ආචාර්ය ආනන්ද කුමාරස්වාමි ලංකාවේ කලාව ඇතුළු සංස්කෘතිකාංග අළලා 1908 ලියන ලද මධ්‍යකාලීන සිංහල කලා නම් කෘතිය ලාංකීය කලාවේ ගාම්භීරත්වය හා අදීනත්වය බටහිරට හඳුන්වාදෙමින් ලාංකික කලාව ලෝකයට ගෙන ගිය ඓතිහාසික කෘතිය මෙය යි.

ශාස්ත්‍රිය සේවයට කැප වූ විද්වතෙකු වන කුමාරස්වාමි භාෂා ගණනාවක් දැන සිටියේ ය. කුමාරස්වාමි පෙරපර දෙදිග භාෂා හැදෑරුවේ භාෂා විශාරදයෙකු වීමට නොව, පෙරදිග සංස්කෘතිය අධ්‍යයනය කිරීම උදෙසා ය. ඔහුගේ ශාස්ත්‍රීය අධ්‍යයන එක් විෂයයකට සීමා වූයේ නොවෙයි.

විවිධ රටවල කලා ගවේෂණයේ යෙදුණ ද ඔහුගේ නිත්‍ය වාසස්ථානය වූයේ එංගලන්තය යි. දෙවැනි ලෝක සංග්‍රාමය අවධියේ ඔහුට එංගලන්තය හැර දමා ඇමරිකාවට යාමට සිදු විය. ඒ ස්වේච්ඡා සේනාවට බැඳීම ප්‍රතික්ෂේප කළ නිසා ය. ඒ නිසා ම ඔහුගේ නිවස පවා රාජසන්තක විය.

(1) අපේ කලාවන් ලොව ප්‍රසිද්ධ වීමට උපකාර වූ කෘතිය කුමක් ද?

(2) ආනන්ද කුමාරස්වාමි විවිධ භාෂා ඉගෙන ගත්තේ කුමක් උදෙසා ද?

(3) ඔහු විවිධ විෂයයන් පිළිබඳ ශාස්ත්‍රිය අධ්‍යයනයන් කළ බව හැඟවෙන ප්‍රකාශය උපුටා ලියන්න.

(4) දෙවැනි ලෝක සංග්‍රාමයට පෙර ඔහු ස්ථිර ව පදිංචිව සිටියේ කවර රටක ද?

(5) ඔහුගේ නිවස පවා ඔහුට අහිමි වූයේ කවර හේතුවක් නිසා ද?

(ලකුණු 1 × 10 = 10)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| (01) | iv | (02) | iii | (03) | iv | (04) | ii | (05) | i | (06) | iii | (07) | iii | (08) | iii |
| (09) | iv | (10) | ii | (11) | iii | (12) | iv | (13) | iii | (14) | ii | (15) | iii | (16) | iv |
| (17) | ii | (18) | i | (19) | ii | (20) | iv | | | | | | | | |

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

01. (i) කතරගම පුද බිම ආශ්‍රිතව
(ii) ගස, ගල, පොත, පුටු ....... ආදී ඕනෑම හතරක්
(iii) මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍ර මහතා / එදිරිවීර සරත්චන්ද්‍ර මහතා
(iv) නයිටිංගේල් කතාව / ඩෙන්මාර්ක ජාතික හාන්ස් ක්‍රිස්ටියන්
(v) පියසේන / පියසේන නමැති ළමයා

02. සුදුසු පරිදි ලකුණු ලබා දෙන්න.
(අත් අකුරු, උක්ත ආඛ්‍යාත, මාතෘකාවට අදාළ වැදගත් කරුණු, වචන ප්‍රමාණය පිළිබඳ අවධානය යොමු කරන්න.)

03. සුදුසු පරිදි ලකුණු ලබා දෙන්න.

04. (i) (අ) නෝන මහත්තයා / පියසේනගේ ස්වාමිදුව
(ආ) පියසේනට
(ii) (අ) එතනහාමි පාඩම
(ආ) ඩිංගිරාලට
(iii) (අ) සැබෑ ලෙංගතුකම
(ආ) සැබෑ නයිටිංගේල් / නයිටිංගේල් / සිංදු කියන කිරිල්ලිය
(iv) (අ) අවුරුදු සිහිනය
(ආ) බුලත් විට විකුණන මහලු කාන්තාවට
(v) (අ) ඩිංගිරාල / එතනහාමිගේ සැමියා
(අ) එතනහාමිට

05. (i) වෙමිවා (ii) නුඹලා
(iii) කරන්නී ය. (iv) ක්‍රීඩකයෝ (ගැළපෙන පදයක්)
(v) බලයි. / කියවයි. (vi) අම්මා (සුදුසු උක්ත පදයක් (ඒක වචන)
(vii) දෙසති / දෙසූහ / දෙසූ සේක (viii) ආවේ ය. / පැමිණියේ ය.
(ix) පාවෙයි (x) ගලාහැලෙයි / ඇද වැටෙයි.

06. 1. මධ්‍ය කාලීන සිංහල කලා
2. පෙරදිග සංස්කෘතිය අධ්‍යයනය කිරීමට
3. "ඔහුගේ ශාස්ත්‍රීය අධ්‍යයන එක් විෂයයකට සීමා වූයේ නොවෙයි"
4. එංගලන්තයේ
5. ස්වේච්ඡා සේනාවට බැඳීම ප්‍රතික්ෂේප කළ නිසා